# 3 ශ්‍රේණිය පරිසරය වැඩපොත

# අංක 15 ( පිළිතුරු සහිතයි )

## (2020 නව නිර්දේශය 15 - මිනිසා සහ තොරතුරු)




**සැකසුම - හසිත හෙට්ටිආරච්චි**

(Dip. In Sci. N.I.E./O.U.S.L.)


{15 ඒකකය - මිනිසා සහ තොරතුරු : විෂය නිර්දේශය සහ ගුරු මාර්ගෝපදේශය ආවරණය වන පරිදි සකස් කර ඇත. }

# 15. තේමාව- මිනිසා සහ තොරතුරු

"සමාජයේ ජීවත් වන පුද්ගලයකු ලෙස අවට ලෝකයේ තොරතුරු පිළිබඳ දැනුම්වත් ව සිටීම වැදගත් වේ. සමාජ, දේශපාලන, ආර්ථික හා ආගමික තොරතුරු පිළිබඳ යාවත්කාලීන දැනුමකින් යුතු ව සිටීම ද වැදගත් ය. වර්තමානයේ තොරතුරු ලබා ගත හැකි මාධ්‍ය බොහෝ ය. විද්‍යුත් මාධ්‍ය හා ලිඛිත මාධ්‍ය සන්නිවේදන මාධ්‍ය අතර ප්‍රධාන ය. මෙවැනි මාධ්‍ය භාවිතයෙන් තොරතුරු හුවමාරු කර ගැනීමේ අවස්ථා මෙන් ම යමක් මැනවින් වාචික ව සන්නිවේදනය කර ගැනීමට අවස්ථා ද ප්‍රායෝගික ව අත්විඳීමට සිසුන්ට අවස්ථා සැලසීම මෙම තේමාවෙන් අපේක්ෂිත ය."

- **ඉගෙනුම් පල**
  - අදහසක් නිරවුල් ව හා නිවැරදි ව අන්‍යයන් ඉදිරියේ ප්‍රකාශ කරයි.
  - පණිවිඩයකට සවන් දී නිවැරදි ව අවබෝධ කර ගෙන එහි අදහස ප්‍රකාශ කරයි.
  - අතීතයේ තොරතුරු හුවමාරු කරගත් ආකාර නම් කරයි.
  - අපට තොරතුරු ලැබෙන සන්නිවේදන මාධ්‍ය මොනවා දැයි ප්‍රකාශ කරයි.
  - සන්නිවේදනයේ දී පවත්වා ගත යුතු යහ පුරුදු ප්‍රදර්ශනය කරයි.
  - තොරතුරු ලැබෙන මාධ්‍යයක් ලෙස පුවත්පත් හඳුනා ගනිමින් ඒවායෙහි තොරතුරු වර්ගීකරණය කරයි.
  - තොරතුරු ලබා ගැනීම සඳහා පුස්තකාලය ඵලදායී ව භාවිත කරයි.
  - හදිසි අවස්ථාවල දී ක්‍රියා කළ යුතු ආකාරය හා දැනුම්වත් කිරීම් සිදු කළ යුතු ආකාරය පිළිබඳ ව අදහස් ප්‍රකාශ කරයි.
  - යම් අයෙකුට සුබ පැතීම සඳහා සුදුසු ආකාරයේ නිර්මාණයක් කරයි.
  - විවිධ සංඥා යොදා ගනිමින් නිර්මාණය කරගත් එළිමහන් ක්‍රීඩාවල නිරත වෙයි.
  - අදහස් ප්‍රකාශ විවිධ භාවප්‍රකාශ ඇති වන ආකාරයට ඉදිරිපත් කරයි.

**01) අණ බෙරකරුවකු ලෙස පන්තියේ සිසුවකු බෙරය ගසමින් පන්තියට පැමිණ පහත දැක්වෙන ආකාරයට කවි ගායනා ඉදිරිපත් කළේය. අණ බෙරකරු ලබාදුන් පණිවිඩයට හොඳින් කියවා ඊට අදාළ ප්‍රශ්න වලට පිළිතුරු ලියන්න.**

**ඩුං ඩුං ඩුං - අසවු අසවු හොඳින් අසවු**
**ඉරිදා දින සවස දෙකට - අපේ පාසලේ ශ්‍රමදානෙට**
**දෙමාපියන්ගෙන් කෙනෙකුට - එන්න කියමු උදළු රැගෙන..........**

**1. පණිවිඩය කුමක් ගැන ද ?**

.......................................................................................................................................

**2. ශ්‍රමදානය පැවැත්වෙන්නේ කවරදා ද?**

.......................................................................................................................................

**3. ශ්‍රමදානය පැවැත්වෙන්නේ කීයට ද ?**

.......................................................................................................................................

**4. ඊට සහභාගි විය යුත්තේ කවරෙක් ද ?**

.......................................................................................................................................

**5. රැගෙන ආ යුත්තේ මොනවා ද ?**

.......................................................................................................................................

**02) පණිවිඩයක් ලබා දීමේ දී එය ලබා දෙන්නා එය කෙසේ ලබා දිය යුතු ද ?**

.......................................................................................................................................

**03) පණිවිඩයක් ඇසීමේ දී අසන්නා එය කෙසේ ඇසිය යුතු ද ?**

.......................................................................................................................................

**04) අතීතයේ දී තොරතුරු හුවමාරු කරගත් ආකාර මොනවා ද ?**



1. ..................................................................................................
2. ..................................................................................................
3. ..................................................................................................
4. ..................................................................................................
5. ..................................................................................................
6. ..................................................................................................

**05) මේ ආකාරයට පාසලේ දී අපට පණිවිඩ ලැබෙන ක්‍රම මොනවා ද ?**

1. ...................................................................... 2. ......................................................................
3. ...................................................................... 4. ......................................................................
5. ...................................................................... 6. ......................................................................

**06) නූතන සන්නිවේදන ක්‍රම මොනවා ද ?**



1. ..................................................................................................
2. ..................................................................................................
3. ..................................................................................................
4. ..................................................................................................
5. ..................................................................................................
6. ..................................................................................................

**07) සිසුන් කණ්ඩායම් කර එක් එක් සිසු කණ්ඩායමට තමන් කැමති යම් දෙයක් අලෙවිය සඳහා ප්‍රචාරණයට සුදුසු දැන්වීමක් කඩදාසියක නිර්මාණය කිරීමේ ක්‍රියාකාරකමේදී ඔබ කණ්ඩායම නිර්මාණය කලේ කුමක් පිළිබඳ වෙළෙඳ දැන්වීමක් ද ?**

..........................................................................................................................................

**08) වෙළෙඳ දැන්වීම් යනු යම් දෙයක් අලෙවිය සඳහා මිනිසුන් ආකර්ෂණය කරගන්නා ඉතා ප්‍රබල මාධ්‍යයක් හෙයින් ඒවායින් ලැබෙන තොරතුරු අප තෝරා බේරාගෙන වටහා ගත යුතුය. ඊට උදාහරණයක් ලියන්න. (උදා : - මත්පැන්, දුම්වැටි ආදිය පිළිබඳ දැන්වීම්)**

..........................................................................................................................................

**09) තම අදහස් ප්‍රකාශ කිරීමේදී සැලකිලිමත් විය යුතු කරුණු මොනවා ද ?**

1. ..................................................................................................
2. ..................................................................................................
3. ..................................................................................................
4. ..................................................................................................

**10) එක් එක් චරිත යුගලයන් අතුරින් එකක් තෝරා ගෙන සුදුසු කෙටි දෙබසක් නිර්මාණය කරන්න. එහිදී ආචාරශීලී වචන යොදා ගන්න. (මව සහ දරුවා, වෛද්‍යවරයා සහ රෝගියා, ආච්චි හා මුනුපුරා, කොන්දොස්තර හා මගියා, වෙළෙන්දා හා පාරිභෝගිකයා, පූජ්‍ය පක්ෂය හා ළමයා)**

..........................................................................................................................................

..........................................................................................................................................

..........................................................................................................................................

..........................................................................................................................................

..........................................................................................................................................

11) සතියක කාලයක් තුළ නිකුත් වූ ජාතික පුවත්පත් කිහිපයක් ඇසුරින් සිසුන්ට යෝග්‍ය වූ ප්‍රවෘත්ති කපා සත කඩදාසි/බ්‍රිස්ටල් බෝඩ් කැබලිවල අලවා සිදු කළ ක්‍රියාකාරකමේදී එසේ ඇලවූ පුවත් කියවා ඔබ ඒවා වර්ග කළේ කෙසේ ද ?

1. ආගමික තොරතුරු.
2. ..............................................................................
3. ..............................................................................
4. ..............................................................................
5. ..............................................................................




12) පාසලේ දී හෝ වෙනත් ස්ථානයක දී හෝ තමාට හෝ වෙනත් අයකුට හෝ අනතුරක් වූ විට ඒ පිළිබඳ තොරතුරු දැන්විය හැකි ක්‍රම හා දැන්විය යුතු අය ගැන ඔබ දැනුම්වත් වූ ආකාරය ඇසුරෙන් අසා ඇති ප්‍රශ්න වලට පිළිතුරු ලියන්න.

1. යාළුවන් දෙදෙනෙක් පාසලේ වැසිකිළියට ගියා. එක් අයකු වැසිකිළිය තුළ සිටිය දී එහි අගුල ඇර ගැනීමට නොහැකි වුවා. එම සිසුවා සමඟ වැසිකිළියට ගිය අනෙක් සිසුවා මෙම සිද්ධිය දැන්විය යුත්තේ කාට ද ? කෙසේ ද ?

.......................................................................................................................

.......................................................................................................................

2. ක්‍රීඩා පිට්ටනියේ දී සෙල්ලම් කරන විට එක් ළමයකුට අනතුරක් සිදු වුණා. මෙය දැන්විය යුත්තේ කාට ද? කෙසේ ද ?

.......................................................................................................................

.......................................................................................................................

3. සෙනඟ බහුල වශයෙන් රැස් වී සිටින ස්ථානයක අතරමං වීම ( උදා : පොළක, තොරණක් ඇති තැනක, සැණකෙළියක) මෙය දැන්විය යුත්තේ කාට ද? කෙසේ ද ?

.......................................................................................................................

.......................................................................................................................

4. පාසල නිමවූ පසු තමා රැගෙන යාමට දෙමාපියන් හෝ වැඩිහිටියකු හෝ නොපැමිණියහොත් දැන්විය යුත්තේ කාට ද ? කෙසේ ද ?

.......................................................................................................................

.......................................................................................................................

5. පන්ති භාර ගුරුතුමිය නොපැමිණෙන දිනයක දී පන්තියේ ළමයකු අසනීප වුවහොත් දැන්විය යුත්තේ කාට ද? කෙසේ ද ?

.......................................................................................................................

.......................................................................................................................

13) යම් අයකුට පණිවිඩයක්/සුබ පැතුමක් ලබාදිය හැකි මාධ්‍ය මොනවා ද ?

.......................................................................................................................

14) තම දෙමවුපියන්ට යැවිය හැකි ආකාරයේ සුබ ප්‍රාර්ථනා මොනවා ද ?

බුදු සරණයි, දෙවි පිහිටයි, ...........................................................................

15) ක්‍රියාකාරකම 8, 9 සහ 10 යන එළිමහන් ක්‍රියාකාරකම් ගුරුතුමා/ගුරුතුමිය සමඟ සිදු කරන්න.

- ක්‍රියාකාරකම 9 දී ලබන අත්දැකීම් පරිදි තමන් ලබා ගන්නා තොරතුරක් හොඳින් මතක තබා ගැනීම ඉතා වැදගත් බව සිහි තබා ගන්න.
- ක්‍රියාකාරකම 10 දී ලබන අත්දැකීම් පරිදි පණිවිඩය අදහසක් ලෙස ගත් කල එය භාවිත කරන ආකාරය අනුවත්, ප්‍රකාශ කරන ආකාරය අනුවත් වෙනත් අයට හිතෙන අදහසට වඩා වෙනත් අරුතක් වුව ලබා දිය හැකි බව සිහි තබා ගන්න.

# 15 තේමාව - පිළිතුරු පත්‍රය.

01) 01. ශ්‍රමදානය ගැන.
02. ඉරිදා දින.
03. සවස දෙකට.
04. දෙමාපියන්ගෙන් කෙනෙක්.
05. උදලු රැගෙන.

02) අන් අයට හොඳින් පැහැදිලි වන ආකාරයෙන් ලබා දිය යුතුය.

03) ඒට හොඳින් සවන් දී නිවැරදි ව පණිවිඩය අවබෝධ කරගත යුතුය.

04) 01. අංග චලන/කතාබහ/කටින් කට.
02. හූ කීම, සීපද කීම.
03. අණ බෙර වැයීම.
04. කොඩි එසවීම.
05. දුම් ගැස්වීම, ගිනි ගොඩක් ගැසීම.
06. කුරුල්ලන් අත පණිවිඩ යැවීම
07. පණිවිඩකරුවන් අත පණිවිඩ යැවීම, අශ්වාරෝහකයන් මගින්.
08. හීතලයෙන් තවත් හී පොලකට පණිවිඩය විදීම.
09. සණ්ටාරය නාද කිරීම. ........වැනි ක්‍රම.

05) 01. සීනුව. 04. ශබ්ද විකාශන යන්ත්‍ර මගින්
02. ශිෂ්‍ය නායකයන් මගින්. 05. කාර්යාල කාර්ය සහායක මගින්.
03. නිවේදන මගින්. 06. රැස්වීම් මගින්. ........වැනි ක්‍රම.

06) 01. ලිපි, ටෙලිමේල්. 04. දුරකථනය.
02. ගුවන්විදුලිය, රූපවාහිනිය. 05. පරිගණකය/අන්තර්ජාලය.
03. .දැන්වීම්, පෝස්ටර්. 06. පුස්තකාලය, පොත්පත්, පුවත්පත්, සඟරා. ........ආදිය.

07) ආහාර වර්ගයක් පිළිබඳව, සෙල්ලම් භාණ්ඩයක් පිළිබඳව. ........ආදිය.

08) පැණි බීම පිළිබඳ දැන්වීම්, කෘත්‍රිම හා ක්ෂණික ආහාර වර්ග පිළිබඳ දැන්වීම්. ........ආදිය.

09) 01. මනා සංයමයෙන් යුතුව කථා කිරීම.
02. අදහස් නිරවුල් ව, හුවමාරු කර ගැනීම.
03. දෙදෙනෙකු එක වර කතා නොකිරීම.
04. ආචාරශීලී ව, සුහද ව කතා කිරීම.
05. අන් අයගේ මත වලට ද ඇහුන්කන් දීම.
06. ප්‍රිය වචන පමණක් කතා කිරීම. ........ආදිය.

10) ළමයා - "අවසරයි, ලොකු හාමුදුරුවනේ, අද අපේ බෝධි පූජාව. මල් වට්ටි ටික නම් හැදුවා."
පූජ්‍ය පක්ෂය - "බුද්ධ පූජාවට ගිලන්පසත් සූදානම් කරන්න. පොඩි හාමුදුරුවෝ පූජාවට වඩියි."
ළමයා - "එහෙමයි, අපේ හාමුදුරුවනේ. මට යන්ඩ අවසර."
පූජ්‍ය පක්ෂය - "හොඳ යි. ගොහින් එන්ඩ."

11) 02. විවිධ රටවල තොරතුරු.
03. බඩු මිල ගැන තොරතුරු.
04. අනතුරු ගැන තොරතුරු.
05. ක්‍රීඩා තොරතුරු.
06. ඉතිහාසය ගැන තොරතුරු. ........ආදිය.

12) 01. ළඟම සිටින වැඩිහිටියෙකුට. යාළුවා වැසිකිළියේ. එයාට අගුල ඇර ගන්න බෑ.
02. පංති භාර ගුරුතුමියට. යාළුවා සෙල්ලම් කරද්දී වැටුණා. එයාට තුවාල වෙලා.
03. නිවේදක මහතාට. වගේ නම ............ . මට ගෙදර අයව මඟ හැරුණා.
04. ආරක්ෂක නිලධාරි මහතාට. තවම ගෙදරින් ඇවිත් නැහැ. මම මොකද කරන්නේ ?
05. අංශ භාර ගුරුතුමියට. යහළුවාට අසනීපයි. අද පංති භාර ගුරුතුමියත් ඇවිත් නැහැ.

13) සුබ පැතුම් පත්, ලිපි යැවීම, දුරකථනයෙන් කෙටි පණිවිඩයක් යැවීම. අන්තර්ජාලය, හඬ තැපැල් (Voice - mail), විද්‍යුත් තැපැල් (E - mail). ........ආදිය.

14) දීර්ඝායුෂ ලැබේ වා, නීරෝග බව ලැබේ වා, සුභ උපන්දිනයක් වේ වා.

15) -